# ක්‍රියාකාරකම් පත්‍රිකාව 2

## ලෝහ වලින් භාණ්ඩ නිෂ්පාදනය

**පහත සඳහන් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. පුරාවිද්‍යාත්මක ගවේෂණ තොරතුරු අනුව සිරියානුවන් විසින් යකඩ සොයා ගෙන ඇත්තේ
   I. ක්‍රි.පූ. 2000 දීය
   II. ක්‍රි.පූ. 1400 දීය
   III. ක්‍රි.පූ. 1300 දීය
   IV. ක්‍රි.පූ. 1100 දීය

02. අමිශ්‍ර ෆෙරස් ලෝහ සඳහා යෙදිය හැකි උදාහරණයකි.
   I. තඹ ලෝහය
   II. සිද්ධ යකඩ
   III. ඇලුමිනියම් ලෝහය
   IV. ටින් ලෝහය

03. ලෝහ වල වර්ණය භෞතික ගුණයට අදාල උදාහරණයකි. එම ලෝහයට අයත් වර්ණය සහ ලෝහය අඩංගු පිළිතුර වන්නේ
   I. පිත්තල - කළු වර්ණය
   II. රත්තරන් - කහ වර්ණය
   III. චීනච්චට්ටි - දුඹුරු වර්ණය
   IV. ඊයම් ලෝහය - රතු වර්ණය

04. සන්ටාර නිපදවීම සඳහා යොදා ගන්නා ලෝහ වර්ගය වන්නේ
   I. ඇලුමිනියම් ලෝහය
   II. මෘදු වානේ ලෝහය
   III. ලෝකඩ ලෝහය
   IV. ටින් ලෝහය

අන්තර්ගතය - ඩී.එම්.එස්.ඒ.දසනායක - කෑ/මාව/පින්නවල ම.ම.වි.,රඹුක්කන
සැකසුම - එච්.කේ.ආර්.ඉෂාරි- මාර/විලයාය ක.වි.,දම්පහල

05. ලෝහවල ගුණ අනුව ප්‍රධාන වශයෙන් වර්ග 5කට වෙන් කරනු ලැබේ. මෙම වර්ග අතුරෙන් කර්මාන්ත ක්ෂේත්‍රයේ දී කාර්මිකයන්ට වඩාත් වැදගත් වන්නේ කුමන ගුණයද?
   I. භෞතික ගුණ
   II. යාන්ත්‍රික ගුණ
   III. තාපීය ගුණ
   IV. රසායනික ගුණ

06. ලෝහය සිසිල් අවස්ථාවේ හෝ රත්කල විට පිපිරීම් වලින් තොරව තැලීමෙන් හෝ මැඩීමෙන් තුනීකර ගැනීම හෝ හැඩ ගසා ගැනීමට හැකියාව ඇත්තේ එහි කිනම් යාන්ත්‍රික ගුණය අඩංගු නිසාද?
   I. විලයනීතාව
   II. තන්‍යතාව
   III. ආඝන්‍යතාව
   IV. ප්‍රත්‍යස්ථතාව

07. සණ්ටාරයක් නඩත්තු කිරීම සඳහා ලෝහ වර්ග කීපයක් මිශ්‍ර කර ගත යුතුය.මෙසේ කළ හැකි වන්නේ ලෝහ වල ඇති විශේෂිත වූ යාන්ත්‍රික ගුණයක් නිසාය. එනම්
   I. තන්‍යතාව ගුණය
   II. විලයනීතාව ගුණය
   III. ආඝන්‍යතාව ගුණය
   IV. සුවිකාර්යතා ගුණය

08. බාහිර බලයක් නිසා එකට ගැටීමෙන් පහසුවෙන් කැඩී කොටස් වලට වෙන්වී යාමෙන් විරූපණයට ලක්විය හැකි අලෝහයක් ලෙස සඳහන් කළ හැක්කේ
   I. දැව වලින් සකස් කරන ලද මේසයක්
   II. වීදුරු වලින් සකස් කරන ලද මේසයක්
   III. ඇලුමිනියම් ලෝහයෙන් සකස් කරන ලද මේසයක්
   IV. චීනච්චට්ටි ලෝහයෙන් සකස් කරන ලද මේසයක්

09. සිඩරයිට් හෙවත් යකඩ කාබනේට් නම් යපස් වර්ගය ලබා ගන්නා රටවල් වනුයේ
   I. ස්වීඩනය , බ්‍රසීලය
   II. ජර්මනිය , කැනඩාව
   III. ජර්මනිය , ඔස්ට්‍රියාව
   IV. ඔස්ට්‍රියාව , එංගලන්තය

අන්තර්ගතය - ඩී.එම්.එස්.ඒ.දසනායක - කෑ/මාව/පින්නවල ම.ම.වි.,රඹුක්කන
සැකසුම - එච්.කේ.ආර්.ඉෂාරි- මාර/විලයාය ක.වි.,දම්පහල